Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය- 5 (3 වාරය)

විෂය:- :- ගණිතය

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 2 මිනිත්තු 40 )

## සංඛ්‍යා රේඛාව හා කාටිසීය තලය

25.1 සංඛ්‍යා රේඛාව

- 7 ශ්‍රේණියේදී, සංඛ්‍යා රේඛාව පිළිබඳව ඔබ උගත් කරුණු සිහිපත් කර ගන්න.
- සංඛ්‍යා රේඛාවේ සංඛ්‍යාවකට දකුණත් පසින් පිහිටා ඇති සංඛ්‍යාවක් මුල් සංඛ්‍යාවට වඩා විශාල වේ. මෙම ගුණය මුළු සංඛ්‍යා රේඛාවටම අදාළ වේ. එම නිසා සංඛ්‍යා රේඛාව භාවිතයෙන් නිඛිල සංසන්දනය කිරීමට මෙම රීතිය අනුගමනය කළ හැකිය.
- පෙළපොතේ (2 කොටස) 102 පිටුව අධ්‍යයනය කර පුණරීක්ෂණ අභ්‍යාසයේ 1,2,3 ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

25.2 සංඛ්‍යා රේඛාව මත භාග හා දශම නිරූපණය

- නිඛිලයක් නොවූ භාගයක් හෝ දශම සංඛ්‍යාවක් සංඛ්‍යා රේඛාවේ නිරූපණය කළ හැකිය. මෙවැනි සංඛ්‍යාවක්, සංඛ්‍යා රේඛාවේ අනුයාත (එක ළඟ පිහිටි) නිඛිල දෙකක් අතර පිහිටයි.
- 104 පිටුව අධ්‍යයනය කර ක්‍රියාකාරකම 1 කරන්න.
- 104,105 පිටු අධ්‍යයනය 25.1 අභ්‍යාසය කරන්න.

25.3 විජීය පදයක් අඩංගු අසමානතා සංඛ්‍යා රේඛාවක් මත නිරූපනය කිරීම

- විජීය පදයක් අඩංගු අසමානතාවක විජීය පදයට ගත හැකි සියලුම අගයන් හෝ එම අගයන් අයත් වන කුලකය එම අසමානතාවයේ විසඳුම් කුලකය ලෙස හැඳින්වේ.
- 106,107 පිටු අධ්‍යයනය කර 25.2 අභ්‍යාසය කරන්න.

25.4 සංඛ්‍යා රේඛාවක් මත අසමානතා නිරූපනය කිරීම

- 108,109 පිටු අධ්‍යයනය කර 25.3 අභ්‍යාසය කරන්න.
- පාඩමේ උගත් කරුණු පිළිබඳව සාරාංශයක් ලියන්න.
- මිශ්‍ර අභ්‍යාසයේ ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.